## චාවකච්චේරි නගර සභාව .

1 .0 . මූල්‍ය ප්‍රකාශන .

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම .

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 19 දින ඉදිරිපත් කරන ලදී . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 14 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය .

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව චාවකච්චේරි නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දින චාවකච්චේරි නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 . මූල්‍ය පකාශ පිළිබඳ අදහස් දැක්වීම් .

1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කර නොතිබුණි .

1.3.2 . ගණකාධිකරණ අඩුපාඩු .

වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන් හි නිරීක්ෂණය වූ ගණකාධිකරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ .

| මූල්‍ය ප්‍රකාශන මත වන බලපෑම . | වියදම් . | |
|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව . | වටිනාකම . රු . |
| වැඩියෙන් දැක්වීම් . | 01 | 18,000 |
| වර්ගීකරණය දෝෂ | 03 | 33,450 |

1.3.3 . විගණනය සඳහා සාක්ෂි නොමැති වීම .

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම .

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,313,559 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය .

1.3.4 . අනුකූල නොවීම් .

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන් හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය .

| | නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | අනුකූල නොවීම . |
|---|---|---|
| ( අ ) | නගර සභා ආඥා පනත . | |
| ( i ) | 76 වගන්තිය . | - නගර සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්හි ඉදිකළ අනවසර ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි . විස්තර පහත දැකවේ . |

| වර්ෂය | අනවසර ගොඩනැගිලි ඉදි කිරීම් සංඛ්‍යාව . |
|---|---|
| 2009 | 35 |
| 2010 | 27 |
| 2011 | 03 |

( ii ) 159 ( උ ) වගන්තිය . - සංස්කෘතික . ආගමික සහ වෙනත් සමාජීය කටයුතු සඳහා වූ වියදම් රු.2,500 කට සීමා කළ යුතුය . කෙසේ වුවද සභාව සංග්‍රහ සහ පෙර පාසැල් කටයුතු වියදම් සඳහා රු.34,840 ක මුදලක් ගෙවා තිබුණි .

( iii ) . 170 ( i ) වගන්තිය . - රු.54,900 ක් වූ හඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි .

( ආ ) මුදල් රෙගුලාසි .

මු . රෙ . 396 - මාස 06 කට වැඩි කාලයක් සඳහා උපලබ්ධි වී නොතිබූ වටිනාකම රු.76,632 ක් වූ චෙක් පත් 07 ක් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි .

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

2 . 1 . මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් රු.47,675,321 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් රු.10,552,010 ක් විය .

2.2 . ආදායම් පරිපාලනය .

2.2.1 . ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය . | 2011 | | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම . |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත රු " 000 | තථ්‍ය රු " 000 | රු " 000 |
| වරිපනම් සහ බදු | 1,181 | 950 | 4,864 |
| කල්බදු කුලී | 9,001 | 9,214 | - |
| බලපත්‍ර ගාස්තු | 649 | 550 | 56 |
| වෙනත් ආදායම් | 47,466 | 25,715 | 7,009 |
| එකතුව . | 58,297 | 36,429 | 11,929 |

2.2.2 . ආදායම් අහිමි වීම .

ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී නොතිබුණ නිසා වීදි ලාම්පු සවි කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් සභාවට රු.297,338 ක පාඩුවක් දැරීමට සිදු වී තිබුණි .

2.2.3 . ලැබිය යුතු ආදායම් .

ඉකුත් කාල පරිච්ඡේද සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට සභාවට තක්සේරු බදු , කුලී , බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් ලෙස රු.11,929,353 ක මුදලක් ලැබිය යුතුව තිබුණි .

2.3 . හඳුනා ගත් හානි සහ පාඩු .

විගණන ආදර්ශ පරීක්ෂාවන් හිදි සහ නගර සභාව විසින් පවත්වාගෙන යන ලද තොරතුරු අනුව රු.3,468,366 ක් වූ පාඩු සහ හානි අනාවරණය විය .

2.4 . අවිධිමත් ගනුදෙනු .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) . ගෙවීම සඳහා බිලපත් , ඉන්වොයිසි නොමැතිව , රු.3,549,839 ක් වූ මුදලක් විවිධ ණය හිමියන් ලෙස ඉදිරියට ගෙනැවිත් තිබුණි .

( ආ ) . අයවැය ලේඛනයේ ප්‍රතිපාදන නොමැතිව තිබිය දී , සභාවේ මන්ත්‍රීන් පිළිගැනීමේ උත්සවය සඳහා රු.7,613 ක මුදලක් වැය කර තිබුණි .

( ඇ ) . අයවැය ලේඛණයේ ප්‍රතිපාදන නොමැතිව තිබිය දී චාවකච්චේරි බස් නැවතුම් පොළ සහ පුස්තකාලය විවෘත කිරීම් උත්සවය සඳහා රු.45,525 ක වියදමක් දරා තිබුණි .

2.5 . අරමුණුවලට පරබාහිර ක්‍රියාකාරකම් .

නව වෙළඳ පොල ඉදි කිරීම පිණිස " සිම්පොසිම් " ප්‍රදර්ශනය සඳහා රු.24,500 ක මුදලක් ගෙවා තිබුණි .

2.6 . මෙහෙයුම් අකාර්යක්ෂමතා .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) . බස් නැවතුම් පොළෙහි බස් ආවරණ ඉදි කිරීම සඳහා රු.4,270,874 ක මුදලක් වැය කර තිබුණි . කෙසේ වුවද , මෙම ගොඩනැගිලි විධිමත් පරිදි සැලසුම් පිළියෙල කර ඉදිකර නොතිබුණු අතර පොදු අවශ්‍යතා සඳහා සුදුසු නොවිය .

---

( ආ ) . 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ අංක 1159 / 22 සහ 2000 නොවැම්බර් 22 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව සභාව විසින් පවත්වාගෙන යන සත්ව ඝාතකාගාරය සඳහා අවසර පත්‍රයක් ලබාගෙන නොතිබුණි . සත්වා ඝාතක ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය පරිදි ඝාතකාගාරය ලියාපදිංචි කර නොතිබුණි .

2.7 . කාර්ය සාධනය .

-------------------

මුදල් වර්ෂය ආරම්භයේ දී සභාව වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි . එම නිසා සපුරා ගැනීමට අපේක්ෂිත අරමුණු සහ ඒවායේ ප්‍රගතිය සොයා දැන ගැනීමට නොහැකි විය .

3 . පද්ධති හා පාලන .

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ .

( අ ) . ආදායම් රැස් කිරීම .
( ආ ) . අයවැය ලේඛණය .
( ඇ ) . වාහන උපයෝජනය .
( ඈ ) . ප්‍රදාන .